# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 26.විශාල හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත

රටේ පවත්නා කොවිඩ්-19 රෝග තත්වය හේතුවෙන් සෞඛ්‍ය හා ආරක්ෂක පියවරයන් දැඩි ලෙස ක්‍රියාත්මක කරමින්, විශාල හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තශාලා අදියර වශයෙන් විවෘත කළ හැකිය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**හිමිකරු / සේවා යෝජකයා**

- රජයේ / සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුකූලව කර්මාන්ත ශාලාව තුළදී කොවිඩ්-19 පාලනය කිරීම සඳහා සූදානම් වීමේ සැලැස්මක් සකස් කිරීම. එය අධීක්ෂණය සඳහා සෞඛ්‍ය ආරක්‍ෂක නිලධාරින් පත් කිරීම.
- ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන්ගේ දුරකථන අංක සහ ජාතික කොවිඩ්-19 වැළැක්වීමේ මධ්‍යස්ථානයේ දුරකථන අංක සහිත ලැයිස්තුවක් පවත්වා ගැනීම.
- සේවකයින් පදිංචි වී සිටින ප්‍රදේශය, ඔවුන්ගේ ලිපිනයන් හා දුරකථන අංක නිවැරදි බවට තහවුරු කර ගැනීම.
- කර්මාන්තශාලාව පිහිටි ප්‍රදේශයේ අවදානම් තත්වය මත පදනම්ව, එක් සේවා මුරයකට සේවකයින් 50% ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් සහභාගී වන පරිදි, සේවා-මුර පදනමින් ක්‍රියාත්මක වීමට කටයුතු සම්පාදනය කිරීම.
- සියළුම සේවකයින්ට රාජකාරියේ යෙදී සිටින විට මුහුණු ආවරණ භාවිතය අනිවාර්ය කිරීම.
- පරිශ්‍රයට ඇතුළු වීමේදී, වැසිකිළි භාවිතයේදී සහ ආහාර ගන්නා ස්ථානවලදී, අත් සේදීමේ පහසුකම් සේවකයින් සඳහා ප්‍රමාණවත් තරම් ඇති බවට වග බලා ගැනීම.
- සෙවා කාලය අතරතුරත්, අවම වශයෙන් වරකට තත්පර 20ක් වත්, සබන් යොදා නිතර අත් සේදීමට සේවකයින් දිරිමත් කිරීම.
- පරිශ්‍රයේ දොරටුව වෙත, ශරීර උෂ්ණත්වය අධීක්ෂණයට අවශ්‍ය උපකරණ සපයා, සාමාන්‍ය උෂ්ණත්වය ඇති අයට පමණක් පරිශ්‍රයට ඇතුළුවීමට ඉඩ ලබා දීම.
- කවුන්ටර, දොරවල්, සේවාපළ (workstation) සහ අත්වැටවල් වැනි නිතර ස්පර්ශ වන පෘෂ්ඨයන් නිරන්තරයෙන් පිරිසිදු කිරීම.
- එකිනෙකා අතර අවම වශයෙන් මීටර එකක පරතරයක් සෑම විටම පවත්වා ගැනීම.
- නියමිත දුරස්ථභාවය පවත්වාගැනීමට හැකිවන පරිදි වැඩපොළවල් සංවිධානය කිරීම.
- කර්මාන්ත ශාලාවේ සියළුම රැස්වීම්, සැමරුම් සහ උත්සව අවලංගු කිරීම.
- හැකි සෑම විටෙකදීම, තාක්‍ෂණික පහසුකම් භාවිතා කරමින් රැස්වීම් පැවැත්වීම (උදා: වීඩියෝ දුරකථන සම්මන්ත්‍රණය)
- සේවක කණ්ඩායම් කොටස් වලට බෙදා, එක් එක් කුඩා කණ්ඩායම් සඳහා වෙන් වෙන් ව තේ සහ ආහාර විවේක ලබාදීම.
- කොවිඩ්-19 වැළැක්වීමේ පියවර පිළිබඳ සියළුම කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (උදා: මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතු ආකාරය, අත් සේදීමේ නියමිත ක්‍රමය, කැස්සකදී භාවිතා කළ යුතු නිසි ආචාර විධි)
- සේවකයින්ට ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් නිවසේ රැඳී සිටීමට දිරිගැන්වීම සහ සේවයට පැමිණියේනම් ඔවුන්ට නැවත නිවෙස වෙත යන ලෙස ඉල්ලා සිටීම.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු

අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම ආයතන හිමිකරු / භාරකරුගේ වගකීම වේ.

සේවකයා

- ඔබට යාන්තමින් හෝ ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් නිවසේ රැඳී සිටින්න.
- සැම විටම මුහුණු ආවරණ නිසි ලෙස පැළඳ ගන්න.
- සැම විටම එකිනෙකා අතර අවම වශයෙන් මීටර 1 ක පරතරයක් පවත්වා ගන්න.
- දුරස්ථභාවය පවත්වාගතහැකි සුබපැතුම් ක්‍රම අනුගමනය කරන්න.
- අවම වශයෙන් වරෙකදී තත්පර 20 ක් වත්, සබන් යොදා ඔබේ අත් නිතරම සෝදන්න.
- පිඟන්, කෝප්ප, වීදුරු සහ වතුර බෝතල් එකිනෙකා අතර හවුලේ භාවිතා නොකරන්න. ටැප් වලින් වතුර බීම නොකරන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙල**

- මහජන ඇමතුම් පද්ධතිය මගින් කෝවිඩ්-19 ට අදාළ සියලුම සෞඛ්‍ය තොරතුරු දිනකට කිහිප වතාවක් බෙදා හැරීම (උදා: වැඩ ආරම්භ කිරීමට පෙර, ආහාර විවේක කාලයේදී)
- පරිශ්‍රයට ඇතුළු වන ස්ථානයේ, අත් සෝදන ස්ථානයේ, ආහාර ගන්නා ස්ථානයේ හා අනෙකුත් සුදුසු ස්ථානයන්හී; පෝස්ටර්, බිත්ති ප්‍රස්ථාර සහ රෝග වැළැක්වීමේ පියවරයන් සහිත වීඩියෝ දර්ශන ප්‍රදර්ශණය කිරීම.
- සැම පැයකටම වරක් දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි සහ අත් සේදීම පිළිබඳ මතක් කිරීම




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

28/05/2020